# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,241 — 1964 නොවැම්බර් 27 වැනි සිකුරාද — 1964.11.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වන කොටස: (I) වන ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

ඇල්.ඕ.—බී. 44/57

### 1958 අංක 12 දරන තේ ආධාර පනත

1958 අංක 12 දරන තේ ආධාර පනතේ 10 වැනි වගන්තිය යටතේ කෘෂිකම්, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද නියෝගය.

සී. ආර්. ඩී. බණ්ඩාරනායක,
කෘෂිකම්, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමති.

1964.11.26 වැනි දින,
කොළඹ දීය.

#### නියෝගය

අංක 13,007 හා 1962 අප්‍රේල් මස 6 වැනි දින දරන ගැසට් පත්‍රයේ පළවූ නියෝගයෙන් සංශෝධනය කරන ලද අංක 11,573 හා 1958 ඔක්තෝබර් මස 31 වැනි දින දරන ගැසට් පත්‍රයේ පළවූ 1958 තේ ආධාර ක්‍රමයේ සේවක (අර්ථසාධක අරමුදල) නියෝග, පහත සඳහන් පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) 2 වැනි නියෝගයෙහි "1958 අංක 12 දරන පනත හෝ තේ ආධාර ක්‍රමයේ සේවය සඳහා ද්වීතීයනය කරනු ලබන සියළුම නිලධාරීන්ට හා සේවකයින්ටද" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1958 අංක 12 දරන පනත, 1962 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට පෙර" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) 4 (i) වැනි නියෝගයෙහි—

(i) "මෙම නියෝගයේ (ii) වැනි ඡේදයේ සඳහන් නිලධාරියකු නොහොත් සේවකයකු හැර අන් සෑම නිලධාරියකුට හෝ සේවකයකුට" යන වචන වෙනුවට "සෑම නිලධාරියකුට හෝ සේවකයකුට" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (ඇ) ඡේදය අගට "හෝ" යන වචනය යෙදීමෙන්,

(iii) (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් අළුත් ඡේදය ඇතුලත් කිරීමෙන් :—

"(ඉ)" 1963 ජනවාරි මස 1 වැනි දිනෙන් ආරම්භ වන සේවය සඳහා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් ලැබීම තම මනාපය බව තේ පාලක වෙත ලියා දන්වූ කෙනෙකුට සහ එම මනාපය ක්‍රියාත්මක වන අවස්ථාවේ පටන්" සහ

(iv) "ක්‍රමය යටතේ සේවය කල සෑම සම්පූර්ණ මාසයක් සඳහාම" යන වචන වෙනුවට "ක්‍රමය යටතේ සේවය කළ සෑම සම්පූර්ණ මාසයක් සඳහා සහ (ඉ) ඡේදය යටතේ ඇති මනාපය අනුව කටයුතු කරන්නන් සම්බන්ධයෙන් 1962 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා ක්‍රමය යටතේ සේවය කළ එක් එක් මාසය සඳහා එවැනි පාරිතෝෂික මුදල් ගණන් බැලිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන්

(3) 4 වැනි නියෝගයේ (ii) වැනි ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) මෙම නියෝග යටතේ පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම් ඇති නිලධාරියකු ආධාර ක්‍රමය යටතේ තමාගේ සම්පූර්ණ සේවා කාලය සඳහා හෝ 1963 ජනවාරි මස 1 වැනි දිනෙන් ආරම්භ වන තමාගේ සේවා කාලය සඳහා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් ලැබීමට වූ තම මනාපය පාවිච්චි කිරීමට අදහස් කරන්නේ නම් මෙම නියෝගය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට තෙමසක් ඇතුලතදී ඔහුගේ මනාපය තේ පාලක වෙත ලියා දන්විය යුතුය."

(4) 4 වැනි නියෝගයේ (ii) ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් ඡේදයන් ඇතුලත් කිරීමෙන් :—

"(iii) 4 (i) වැනි නියෝගයේ (ඉ) ඡේදයෙහි සඳහන් කර ඇති මනාපය පාවිච්චි කල කිසිදු නිලධාරියකුට හෝ සේවකයකුට 1963 ජනවාරි මස 1 වැනි දිනට පසුව ඇති සේවා කාලය සඳහා මෙම නියෝග යටතේ කිසිදු පාරිතෝෂිකයක් ලැබීමට හිමිකමක් නැති විය යුතු ය."

"(iv) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් ලැබීමට තීරණය කර ඇති කිසිදු නිලධාරියකුට හෝ සේවකයකුට මෙම ක්‍රමය යටතේ ඔහුගේ සම්පූර්ණ සේවා කාලය සඳහා මෙම නියෝග යටතේ කිසිදු පාරිතෝෂිකයක් ලැබීමට හිමිකමක් නැති විය යුතුය."

(5) 6 වැනි නියෝගයෙහි "යම් නිලධාරියකු හෝ සේවකයකු" යන වචන වෙනුවට "මෙම නියෝග යටතේ පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම් ඇති යම් නිලධාරියකු හෝ සේවකයකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(6) 8 වැනි නියෝගයෙහි—

(අ) "අරමුදල රු. 15,000ක මුදලක්" යන වචන වෙනුවට "අරමුදල මුදලක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) "එම වර්ෂය තුළදී, දෙකෙන් වැඩි මුදල" යන වචන වෙනුවට "එම වර්ෂය තුළදී" යන වචන ආදේශ කිරීමෙන් ; හා

(7) පහත සඳහන් අළුත් නියෝගය ඇතුලත් කිරීමෙන් :—

"8 (අ) තේ ආධාර ක්‍රමයේ සේවක අර්ථසාධක අරමුදලෙහි බැරට ඇති යම් මුදලක්—

(i) සේවයෙන් පහ නොකරන ලද්දේ නම්, පහ කරන ලද නිලධාරියකුට ;

(ii) ජීවතුන් අතර නැති නිලධාරියාගේ යැපෙන්නන් සිටියේ නම් ඔවුන්හට ;

(iii) මෙම ක්‍රමය යටතේ නිලධාරියකුගේ සම්පූර්ණ සේවය හෝ ඉන් කොටසක් සඳහා විශ්‍රාම වැටුප් තත්ත්වය ලැබීමේ මනාපය යම් නිලධාරියකු විසින් පාවිච්චි නොකරන ලද්දේ නම්, එවැනි නිලධාරියකු හට

ගෙවන්නට යෙදුණේ යයි සලකා තේ ආධාර අරමුදලෙහි නැවත තැන්පත් කළ හැකිය."

11-1149/1

---

ඇල්.ඩී—බී. 44/57.

## 1953 අංක 36 දරන රබර් නැවත වගාකිරීමේ ආධාර පනත

1953 අංක 36 දරන රබර් නැවත වගාකිරීමේ ආධාර පනතේ 8 වැනි වගන්තිය යටතේ කෘෂිකම්, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද නියෝගය.

සී්. ආර් ඩී. බණ්ඩාරනායක,
කෘෂිකම්, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමති.

1964. 11. 26 වැනි දින,
කොළඹ දී ය.

### නියෝගය

එපින්වර සංශෝධනය කරන ලද අංක 11,300 හා 1958 අප්‍රේල් මස 18 වැනි දින දරණ ගැසට් පත්‍රයේ පළවූ 1958 රබර් නැවත වගා කිරීමේ ආධාර ක්‍රමයේ සේවකයින්ගේ (අර්ථසාධක අරමුදල) නියෝග පහත සඳහන් පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) 2 වැනි නියෝගයෙහි "1953 අංක 36 දරන පනත හෝ රබර් නැවත වගාකිරීමේ ආධාර ක්‍රමයේ සේවය සඳහා ද්විතීයනය කරනු ලබන සියළුම නිලධාරීන්ට හා සේවකයින්ටද" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1953 අංක 36 දරන පනත, 1962 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට පෙර" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) 4 (i) වැනි නියෝගයෙහි

(i) "මෙම නියෝගයේ (ii) වැනි ඡේදයේ සඳහන් නිලධාරියකු හෝ සේවකයකු හැර අන් සෑම නිලධාරියකුට හෝ සේවකයකුට" යන වචන වෙනුවට සෑම නිලධාරියකුටම හෝ සේවකයකුට" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (ඇ) ඡේදය අගට "හෝ" යන වචනය යෙදීමෙන් ;

(iii) (ඇ) ඡේදයට ඉක්බිතිවම, පහත සඳහන් අළුත් ඡේදය ඇතුලත් කිරීමෙන් :—

"(ඉ)" .963 ජනවාරි මස 1 වැනි දිනෙන් ආරම්භ වන සේවය සඳහා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ විශ්‍රාම වැටුප් ලැබීම තම මනාපය බව රබර් පාලක වෙත ලියා දන්වූ කෙනෙකුට සහ එම මනාපය ක්‍රියාත්මක වන අවස්ථාවේ පටන්" සහ

(iv) "ක්‍රමය යටතේ සේවය කළ සෑම සම්පූර්ණ මාසයක් සඳහාම" යන වචනය වෙනුවට "ක්‍රමය යටතේ සේවය කළ සෑම සම්පූර්ණ මාසයක් සඳහා සහ (ඉ) ඡේදය යටතේ ඇති මනාපය අනුව කටයුතු කරන්නන් සම්බන්ධයෙන් 1962 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා ක්‍රමය යටතේ සේවය කළ එක් එක් මාසය සඳහා එවැනි පාරිතෝෂික මුදල් ගණන් බැලිය යුතුය" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) 4 වැනි නියෝගයේ (ii) වැනි ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) මෙම නියෝග යටතේ පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම් ඇති නිලධාරියකු දෙපාර්තමේන්තුවේ තමාගේ සම්පූර්ණ සේවා කාලය සඳහා හෝ 1963 ජනවාරි මස 1 වැනි දිනෙන් ආරම්භ වන තමාගේ සේවා කාලය සඳහා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් ලැබීමට වූ තම මනාපය පාවිච්චි කිරීමට අදහස් කරන්නේ නම් මෙම නියෝගය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට තෙමසක් ඇතුළතදී ඔහුගේ මනාපය රබර් පාලක වෙත ලියා දැන්විය යුතුය."

(4) 4 වැනි නියෝගයේ (2) ඡේදයට ඉක්බිතිව ම පහත සඳහන් ඡේදයන් ඇතුලත් කිරීමෙන් :—

"(3) 4 (i) වැනි නියෝගයේ (ඉ) ඡේදයෙහි සඳහන් කර ඇති මනාපය පාවිච්චි කළ කිසිදු නිලධාරියකුට හෝ සේවකයකුට 1963 ජනවාරි මස 1 වැනි දිනට පසුව ඇති සේවාකාලය සඳහා මෙම නියෝග යටතේ කිසිදු පාරිතෝෂිකයක් ලැබීමට හිමිකමක් නැති විය යුතුය."

(4) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් ලැබීමට තීරණය කර ඇති කිසිදු නිලධාරියකුට හෝ සේවකයකුට දෙපාර්තමේන්තුවේ තමාගේ සම්පූර්ණ සේවා කාලය සඳහා මෙම නියෝග යටතේ කිසිදු පාරිතෝෂිකයක් ලැබීමට හිමිකමක් නැති විය යුතුය."

(5) 6 වැනි නියෝගයෙහි "යම් නිලධාරියකු හෝ සේවකයකු" යන වචන වෙනුවට "මෙම නියෝග යටතේ පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම් ඇති යම් නිලධාරියකු හෝ සේවකයකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(6) 8 වැනි නියෝගයෙහි—

(අ) "අරමුදල රු. 15,000 ක මුදලක්" යන වචන වෙනුවට "අරමුදල මුදලක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) "එම වර්ෂය තුළදී. දෙසෙන් වැඩි මුදල" යන වචන වෙනුවට "එම වර්ෂය තුළදී" යන වචන ආදේශ කිරීමෙන් ; හා

(7) පහත සඳහන් අළුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :—

"8(අ) රබර් නැවත වගාකිරීමේ ආධාර ක්‍රමයේ සේවක අර්ථසාධක අරමුදලෙහි බැරට ඇති යම් මුදලක්—

(i) සේවයෙන් පහ නොකරන ලද්දේ නම්, පහ කරන ලද නිලධාරියකුට ;

(ii) ජීවතුන් අතර නැති නිලධාරියාගේ යැපෙන්නන් සිටියේ නම් ඔවුන් හට ;

(iii) මෙම ක්‍රමය යටතේ නිලධාරියකුගේ සම්පූර්ණ සේවය හෝ ඉන් කොටසක් සඳහා විශ්‍රාම වැටුප් තත්ත්වය ලැබීමේ මනාපය යම් නිලධාරියකු විසින් පාවිච්චි නොකරන ලද්දේ නම්, එවැනි නිලධාරියකු හට

ගෙවන්නට යෙදුණේ යයි සලකා රබර් නැවත වගාකිරීමේ ආධාර අරමුදලෙහි නැවත තැන්පත් කළ හැකිය."

11-1149/2

---

ඇල්.ඩී—බී. 44/57

## 1957 අංක 51 දරන තේ පාලන පනත

1957 අංක 51 දරන තේ පාලන පනතේ 49 වැනි හා 60 වැනි වගන්ති යටතේ කෘෂිකම්, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද නියෝගය.

සී්. ආර් ඩී. බණ්ඩාරනායක,
කෘෂිකම්, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමති.

1964.11.26 වැනි දින,
කොළඹදීය.

### නියෝගය

අංක 13,692 හා 1963 ජූලි මස 5 වැනි දින දරන ගැසට් පත්‍රයේ පළවූ නියෝගයෙන් සංශෝධනය කරනලද අංක 11.618 හා 1958 දෙසැම්බර් මස 19 වැනි දින දරන ගැසට් පත්‍රයේ පළවූ 1958 තේ පාලන දෙපාර්තමේන්තු (පාරිතෝෂික ක්‍රමය) නියෝගය පහත සඳහන් පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) 2 වැනි නියෝගයෙහි "1957 අංක 51 දරන පනත හෝ තේ පාලන දෙපාර්තමේන්තු සේවය සඳහා ද්විතීයනය කරනු ලබන සියළුම නිලධාරීන්ට හා සේවකයින්ටද" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1957 අංක 51 දරන පනත, 1962 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට පෙර" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) 4 (i) වැනි නියෝගයෙහි—

(i) "මෙම නියෝගයෙහි (ii) වැනි ඡේදයේ සඳහන් කර ඇති නිලධාරියකු හෝ සේවකයකු හැර අන් සෑම නිලධාරියකුට හෝ සේවකයකුට" යන වචන වෙනුවට "සෑම නිලධාරියකුට හෝ සේවකයකුට" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (ඇ) ඡේදය අගට "හෝ" යන වචනය යෙදීමෙන් ;

(iii) (ඇ) ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන් ;

"(ඉ) 1963 ජනවාරි මස 1 වැනි දිනෙන් ආරම්භ වන සේවය සඳහා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් ලැබීම තම මනාපය බව තේ පාලක වෙත ලියා දැන්වූ කෙනෙකුට සහ එම මනාපය ක්‍රියාත්මක වන අවස්ථාවේ පටන් ;" සහ

(iv) "දෙපාර්තමේන්තුවේ සේවය කළ සෑම සම්පූර්ණ මාසයක් සඳහාම" යන වචන වෙනුවට "දෙපාර්තමේන්තුවේ සේවය කළ සෑම සම්පූර්ණ මාසයක් සඳහාම සහ (ඉ) ඡේදය යටතේ ඇති මනාපය අනුව කටයුතු කරන්නන් සම්බන්ධයෙන් 1962 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා දෙපාර්තමේන්තුවේ සේවය කළ එක් එක් මාසය සඳහා එවැනි පාරිතෝෂික මුදල් ගණන් බැලිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ;

(3) 4 වැනි නියෝගයේ (ii) වැනි ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) මෙම නියෝග යටතේ පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම් ඇති නිලධාරියකු දෙපාර්තමේන්තුවේ තමාගේ සම්පූර්ණ සේවා කාලය සඳහා හෝ 1963 ජනවාරි මස 1 වැනි දිනෙන් ආරම්භ වන තමාගේ සේවා කාලය සඳහා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් ලැබීමට වූ තම මනාපය පාවිච්චි කිරීමට අදහස් කරන්නේ නම් මෙම නියෝගය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට තෙමසක් ඇතුළතදී ඔහුගේ මනාපය තේ පාලක වෙත ලියා දැන්විය යුතුය."

(4) 4 වැනි නියෝගයේ (ii) ඡේදයට ඉක්බිතිව පහත සඳහන් ඡේදයන් ඇතුළත් කිරීමෙන් :—

"(iii) 4 (i) වැනි නියෝගයේ (ඉ) ඡේදයෙහි සඳහන් කර ඇති මනාපය පාවිච්චි කළ කිසිදු නිලධාරියකුට හෝ සේවකයකුට 1963 ජනවාරි මස 1 වැනි දිනට පසුව ඇති සේවා කාලය සඳහා මෙම නියෝග යටතේ කිසිදු පාරිතෝෂිකයක් ලැබීමට හිමිකමක් නැති විය යුතුය."

"(iv) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් ලැබීමට තීරණය කර ඇති කිසිදු නිලධාරියකුට හෝ සේවකයකුට දෙපාර්තමේන්තුවේ ඔහුගේ සම්පූර්ණ සේවය සඳහා මෙම නියෝග යටතේ කිසිදු පාරිතෝෂිකයක් ලැබීමට හිමිකමක් නැති විය යුතු ය."

(5) 6 වැනි නියෝගයෙහි "යම් නිලධාරියකු හෝ සේවකයකු" යන වචන වෙනුවට "මෙම නියෝග යටතේ පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම් ඇති යම් නිලධාරියකු හෝ සේවකයකු" යන වචන ආදේශ කිරීමෙන් :—

(6) 8 වැනි නියෝගයෙහි—

(අ) "අරමුදල රු. 15,000 ක මුදලක්" යන වචන වෙනුවට "අරමුදල මුදලක්" යන වචන ආදේශ කිරීමෙන් : සහ

(ආ) "එම වර්ෂය තුළදී, දෙකෙන් වැඩි මුදල" යන වචන වෙනුවට "එම වර්ෂය තුළදී" යන වචන ආදේශ කිරීමෙන් ; හා

(7) පහත සඳහන් අළුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :—

"8(අ) පාරිතෝෂික ක්‍රමයෙහි බැරට ඇති යම් මුදලක්—

(i) සේවයෙන් පහ නොකරන ලද්දේ නම්, පහ කරනලද නිලධාරියකුට ;

(ii) ජීවතුන් අතර නැති නිලධාරියාගේ යැපෙන්නන් සිටියේ නම් ඔවුන් හට ;

(iii) තේ පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරියකුගේ සම්පූර්ණ සේවය හෝ ඉන් කොටසක් සඳහා විශ්‍රාම වැටුප් තත්ත්වය ලැබීමේ මනාපය යම් නිලධාරියකු විසින් පාවිච්චි නොකරන ලද්දේ නම් එවැනි නිලධාරියකු හට ගෙවන්නට යෙදුනේ යයි සලකා තේ පාලන අරමුදලෙහි නැවත තැන්පත් කළ හැකිය."

11-1149/3

---

ඇල්.ඩී.—බී. 44/57.

## 1956 අංක 11 දරන රබර් පාලන පනත

1956 අංක 11 දරන රබර් පාලන පනතේ 42 හා 51 වැනි වගන්ති යටතේ කෘෂිකර්ම, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් පනවන ලද නියෝගය.

පී f. ආර්. ඩී. බණ්ඩාරනායක,
කෘෂිකම්, ආහාර හා ධීවර කටයුතු පිළිබඳ ඇමති.

1964.11.26 වැනි දින,
කොළඹ දී ය.

### නියෝගය

වරින් වර සංශෝධනය කරන ලද අංක 11,114 හා 1957 මැයි මස 3 වැනි දින දරන ගැසට් පත්‍රයේ පළවූ 1957 රබර් පාලන දෙපාරතමේන්තු (පාරිතෝෂික ක්‍රමය) නියෝගය පහත සඳහන් පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) 2 වැනි නියෝගයෙහි "1956 අංක 11 දරන පනත හෝ රබර් පාලන දෙපාර්තමේන්තු සේවය සඳහා ද්විතීයනය කරනු ලබන සියළුම නිලධාරින්ට සහ සේවකයින්ටද" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1956 අංක 11 දරන පනත, 1962 දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට පෙර" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) 4 (i) වැනි නියෝගයෙහි—

(i) "මෙම නියෝගයේ (II) වැනි ඡේදයේ සඳහන් නිලධාරියකු හෝ සේවකයකු හැර අන් සෑම නිලධාරියකුට හෝ සේවකයකුට" යන වචන වෙනුවට "සෑම නිලධාරියකුට හෝ සේවකයකුට" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) (ඇ) ඡේදය අගට "හෝ" යන වචනය යෙදීමෙන් ;

(iii) (ඇ) ඡේදයට ඉක්බිතිවම, පහත සඳහන් අළුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඉ) 1963 ජනවාරි මස 1 වැනි දිනෙන් ආරම්භ වන සේවය සඳහා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාව යටතේ විශ්‍රාම වැටුප් ලැබීම තම මනාපය බව රබර් පාලක වෙත ලියා දැන්වූ කෙනෙකුට සහ එම මනාපය ක්‍රියාත්මක වන අවස්ථාවේ පටන්" ; සහ

(iv) "දෙපාර්තමේන්තුවේ සේවය කළ සෑම සම්පූර්ණ මාසයක් සඳහාම" යන වචන වෙනුවට "දෙපාර්තමේන්තුවේ සේවය කළ සෑම සම්පූර්ණ මාසයක් සඳහා සහ (ඉ) ඡේදය යටතේ ඇති මනාපය අනුව කටයුතු කරන්නන් සම්බන්ධයෙන් 1962 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා දෙපාර්තමේන්තුවේ සේවය කළ එක් එක් මාසය සඳහා එවැනි පාරිතෝෂික මුදල් ගණන් බැලිය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ;

(3) 4 වැනි නියෝගයේ (ii) වැනි ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) මෙම නියෝග යටතේ පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම් ඇති නිලධාරියකු දෙපාර්තමේන්තුවේ තමාගේ සම්පූර්ණ සේවා කාලය සඳහා හෝ 1963 ජනවාරි මස 1 වැනි දිනෙන් ආරම්භ වන තමාගේ සේවා කාලය සඳහා විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් ලැබීමට වූ තම මනාපය පාවිච්චි කිරීමට අදහස් කරන්නේ නම් මෙම නියෝගය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින සිට තෙමසක් ඇතුළතදී ඔහුගේ මනාපය රබර් පාලක වෙත ලියා දැන්විය යුතුය."

(4) 4 වැනි නියෝගයේ (ii) ඡේදයට ඉක්බිතිවම පහත සඳහන් ඡේදයන් ඇතුළත් කිරීමෙන් :—

"4 (1) වැනි නියෝගයේ (ඉ) ඡේදයෙහි සඳහන් කර ඇති මනාපය පාවිච්චි කළ කිසිදු නිලධාරියකුට හෝ සේවකයකුට 1963 ජනවාරි මස 1 වැනි දිනට පසුව ඇති සේවා කාලය සඳහා මෙම නියෝග යටතේ කිසිදු පාරිතෝෂිකයක් ලැබීමට හිමිකමක් නැති විය යුතුය."

"(4) විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් ලැබීමට තීරණය කර ඇති කිසිදු නිලධාරියකුට හෝ සේවකයකුට දෙපාර්තමේන්තුවේ තමගේ සම්පූර්ණ සේවා කාලය සඳහා මෙම නියෝග යටතේ කිසිදු පාරිතෝෂිකයක් ලැබීමට හිමිකමක් නැති විය යුතුය"

(5) 6 වැනි නියෝගයෙහි "යම් නිලධාරියකු හෝ සේවකයකු" යන වචන වෙනුවට "මෙම නියෝග යටතේ පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම් ඇති යම් නිලධාරියකු හෝ සේවකයකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(6) 8 වැනි නියෝගයෙහි—

(අ) "අරමුදල රු. 15.000 ක මුදලක්" යන වචන වෙනුවට "අරමුදල මුදලක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) "එම වර්ෂය තුළදී, දෙකෙන් වැඩි මුදල යන වචන වෙනුවට "එම වර්ෂය තුළදී" යන වචන ආදේශ කිරීමෙන් ; හා

(7) පහත සඳහන් අළුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :—

"8 (අ) පාරිතෝෂික ක්‍රමයෙහි බැරට ඇති යම් මුදලක්—

(i) සේවයෙන් පහ නොකරන ලද්දේ නම්, පහ කරන ලද නිලධාරියකුට ;

(ii) ජීවතුන් අතර නැති නිලධාරියාගේ යැපෙන්නන් සිටියේ නම් ඔවුන් හට ;

(iii) රබර් පාලන දෙපාර්තමේන්තුවේ නිලධාරියකුගේ සම්පූර්ණ සේවය හෝ ඉන් කොටසක් සඳහා විශ්‍රාම වැටුප් තත්ත්වය ලැබීමේ මනාපය යම් නිලධාරියකු විසින් පාවිච්චි නොකරන ලද්දේ නම්, එවැනි නිලධාරියකු හට ;

ගෙවන්නට යෙදුනේයයි සලකා රබර් පාලන අරමුදලෙහි නැවත තැන්පත් කළ හැකි ය."

11-1149/4

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි